ඝාතන-දිවි තොරකර ගැනීම් යනු සුලභ සිදුවීම් නොවේ. එවැනි සිදුවීම් සඳහා සාමාන්‍ය දිවි තොරකර ගැනීමේ සිදුවීමකට වඩා වැඩි අවධානයක් බොහෝ විට ලැබේ. එනිසා, ඝාතන-දිවි තොර කරගැනීම් වාතර්‍ා කිරීමේදී මාධ්‍ය වඩාත් ප්‍රවේසම් සහගත හා ආචාර ධාමර්‍ික විය යුතු වේ.

මේ වන විට මාධ්‍ය වඩාත් ප්‍රවේසම් සහගතව සහ මාධ්‍ය මාගෙර්ාපදේශයන් උල්ලංඝනය නොකරමින් දිවි තොරකරගැනීම් පිළිබඳ වාතර්‍ා කිරීමේ යහපත් ප්‍රවණතාවයක් පෙනී ගියද එය තවදුරටත් වධර්‍නය විය යුතු බව අපේ නිරීක්ෂණයයි.

ඊට නිදසුන් ලෙස, සීදුව රද්දොළුව ප්‍රදේශයේ අයෙකු, සිය වැඩිමහල් සොයුරාගේ දියණියද මරණයට පත් කර, තමන් ද ජීවිතය නැති කරගත් බවට පොලීසිය පවසන සිදුවීමක් පුවත්පත් මඟින් වාතර්‍ා කොට ඇති ආකාරය මෙහිදී සලකා බැලීමට හැක.

මෙහිදී දිවි තොර කරගැනීම සිදුවූ ආකාරය සිරස්තල තුළ සහ පුවත් අන්තගර්‍තය තුළ දැක්වීමත්, එම පුවත ප්‍රමුඛතාවයකින් යුතුව මුල් පිටුවෙහි ප්‍රධාන සිරස්තලය ලෙස පළ කර තිබීමත් දක්නට ලැබිණි.

එසේම මෙම පුවත සමඟ හදිසි උපකාරක අංක සඳහන්ව නොතිබුණි. මෙවැනි පුවත් වාතර්‍ාවන් සමඟින් හදිසි උපකාරක අංක සඳහන් කිරීම තුළින්, මෙවැනි ක්‍රියාවකට නැඹුරුතාවයක් ඇති අයෙකුට උපදේශනය වෙත යොමුවීමට උත්තේජනයක් සැපයීමටත්, ඒ ඔස්සේ මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමටත් ඉඩක් ලැබිය හැකි නොවේදැයි අප ඇසිය යුතුයි.

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර්‍ කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!